UNIVERSITY COLLEGE OF KULIYAPITIYA

**2023/2024 වර්ෂය සඳහා කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතන ආපන ශාලා සේවය පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීමේ ආරාධනයයි.**

1. කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනය නියෝජනය කරමින් එහි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනය 2023/2024 වසර සඳහා ආපන ශාලා සේවය පවත්වාගෙන යාමට යාම සඳහා සුදුසුකම් ලත් ලංසු කරුවන්ගේ මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. වෙළඳපොල සැලසුම් ක්‍රමය මත ලංසු කැඳවීමේ පටිපාටිය යටතේ ලංසු කැඳවීම සිදු කෙරේ.

3. ලංසු ඉදිරිපත් කිරීම සඳහා මූලික සුදුසුකම් වශයෙන් ලංසුකරු අසාදු ලේඛනගත නොවූ ලංසුකරුවෙකු විය යුතුය.

4. වැඩිදුර තොරතුරු සතියේ දිනවල දුරකථන අංක 037-2059570/037-2059572 අමතා කුලියපිටිය විශ්වවිද්‍යාලවිද්‍යායතනයේ සහකාර ලේඛකාධිකාරී කාර්යාලයෙන් විමසිය හැක.

5. සම්පූර්ණ ලංසු කැඳවීමේ ලේඛන කට්ටල සහකාර ලේඛකාධිකාරී ආමන්ත්‍රණය කර ලියූ ලිඛිත ඉල්ලීමක් අතේ ගෙනවිත් බාර දීමෙන් හෝ ඊමේල් ලිපිනය (universitycollegekuliyapitiya@gmail.com) හරහා යොමු කිරීමෙන් 16/05/2023 සිට 07/06/2023 දක්වා සාමාන්‍ය වැඩ කරන දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා ලබාගත හැක. ආපසු නොගෙවන ගාස්තු වශයෙන් ගෙවන රුපියල් 1000/= මුදලක් කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය අංශයට ගෙවීම් කර ලැබෙන කුවිතාන්සිය හෝ කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනය නමින් ඇති කුලියාපිටි ශාඛාවේ ගිණුම් අංක - 028100130035492 බැර කර එම කුවිතාන්සිය ඉදිරිපත් කර සම්පූර්ණ ලංසු කැඳවීමේ ලේඛන ලබාගත හැකිය.

6. ලංසු කැඳවීමේ ලේඛන අන්තර්ජාලය හරහා ලබා ගැනීමේ දී, සෑම ලංසු කරුවෙක්ම ඉහත 6 වෙනි වගන්තිය සඳහන් කර ඇති ආපසු නොගෙවන ගාස්තු වශයෙන් ගෙවූ ගෙවීමේ කුවිතාන්සියේ ස්කෑන් පිටපතක් ලංසු කැඳවීමේ ලේඛන ලබාදෙන මෙන් සිදු කළ ලිඛිත ඉල්ලීම සමග විශ්ව විද්‍යාල විද්‍යායතනයේ සහකාර ලේඛකාධිකාරී භාරයේ ඇති universitycollegekuliyapitiya@gmail.com විද්‍යුත් තැපැල වෙත යොමු කළ යුතුය. එසේ වුවද එම කුවිතාන්සියේ මුල් පිටපත ටෙන්ඩරය සමග ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

7. මුද්‍රා තැබූ ලංසු 2023/06/07 දින පස්වරු 02.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය හැක. තවද 2023/06/07 දින පස්වරු 02.00 ට හෝ ඊට පෙර සහකාර ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක. ප්‍රමාද වූ ලංසු විවෘත කිරීමෙන් තොරව ආපසු හරවා යවනු ලැබේ. ලංසු විවෘත කිරීම එදිනම පස්වරු 02.15 සිදු කෙරේ.

8. සෑම ලංසුකරුවෙකුම, ලංසු සුරක්ෂණය ලෙස, ආපසු ගෙවනු ලබන රුපියල් 2000/= මුදලක් තැන්පත් කළ යුතු අතර එම මුදල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය අංශය වෙත ගෙවීමෙන් ලැබෙන කුවිතාන්සිය හෝ කුලියාපිටි විශ්ව විශ්වවිද්‍යාල විද්‍යායතනයේ නමින් ඇති අංක 028100130035492 දරන මහජන බැංකුවේ කුලියාපිටිය ශාඛාවේ ගිණුමේ තැන්පත් කිරීමෙන් ලද බැංකු කුවිතාන්සිය ටෙන්ඩරය සමග ඉදිරිපත් කිරීම අනිවාය් වේ.

9. කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්, ශිෂ්‍යයන්ට හෝ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින්ට මෙම සේවාව සඳහා අයදුම් කිරීමට අවසර දෙනු නොලැබේ.

**සභාපති**
**ප්‍රසම්පාදන කමිටුව**
**කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනය,**
**අශෝක මාවත, පන්නල පාර,**
**කුලියාපිටිය.**